ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-10-18 |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ඒ.එච්.එම්. අසංක මයා,<br>අංක 205, 06 ගම්මානය,<br>ඌරියාව, ආණමඩුව. |
| වගඋත්තර පාර්ශවය | : | ලේකම්,<br>වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>පළාත් සභා සංකීර්ණය<br>කුරුණෑගල. |

<u>පැමිණිලි අංකය : HRC/AP/586/2017 (W)</u>

**පැමිණිල්ල -:**

වයඹ පළාතේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට 2017 වර්ෂයේ නිකුත් කරන ලද ගැසට් නිවේදනය අනුව උපාධිධාරීන් බඳවා ගැනීමේදී අදාළ විභාගය සමත් වී නියමිත මූලික සුදුසුකම්ද සපුරා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ඉහලින්ම සමත්ව සිටියදී ගුරු සේවයට බඳවා නොගැනීම තුළින් සිය මූලික අයිතිවාසිකම් කඩවූ බවට පැමිණිල්ල මඟින් කරුණු ඉදිරිපත් කර ඇත.

**පැමිණිල්ල මඟින් ඉදිරිපත් කර ඇති කරුණුවල සාරාංශය :-**

පැමිණිලිකරු වයඹ පළාතේ පාසල් සඳහා ශ්‍රී ලංකා ගුරු ශ්‍රේණියේ III වන පන්තියේ 1 " ආ" ශ්‍රේණියේ පුරප්පාඩු වලට අදාළව දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීමේ 2017 ගැසට් නිවේදනය අනුව අයදුම්කර ඒ සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වී සිංහල මාධ්‍ය සඳහා පැවති විභාගයෙන් ලකුණු 104 ක් ලබා සමත් වූ බව ප්‍රකාශ කර ඇත.



ප්‍රධාන කාර්යාලය 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. සභාපති 011-2505451 ෆැක්ස් 011-2505541/ 74 ඊමේල් sechrcsl@gmail.com
பிரதான அலுவலகம் 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. தவிசாளர் தொலைநகல் மின்னஞ்சல்
Head Office 14, R.A. De Mel Mawatha, Colombo - 04. Chairperson Fax

පැමිණිලිකරු ප්‍රථම මනාපය ප්‍රාථමික ලෙසද, දෙවන මනාපය සිංහල විෂය ලෙසද අයදුම්කර තිබූ බවත්, ප්‍රාථමික විෂය සඳහා කඩඉම් ලකුණු 80ක්ද, සිංහල විෂය සඳහා කඩඉම් ලකුණු 84 ක්ද වූ බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැමිණිලිකරු ලකුණු 104 ක් ලබා තිබීම මත මෙම විෂයයන් දෙක සඳහාම සුදුසුකම් ලැබූ බවද ප්‍රකාශ කර ඇත.

ඉන් අනතුරුව ඒ සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී එයින්ද සමත් වූ බවත්, පසුව ප්‍රායෝගික පරීක්ෂණයට මුහුණදී එම පරීක්ෂණයෙන් ලකුණු 10න් ලකුණු 07 ක් ලබාගත් බවත්, ඒ අනුව මුළු ලකුණු සංඛ්‍යාව 111 ක් වූ බවත් ප්‍රකාශ කර ඇත.

ප්‍රාථමික විෂය සඳහා ගුරු පත්වීම් ලබාදීමේදී ප්‍රායෝගික පරීක්ෂයේ ලකුණු ද එකතු කළ පසු මුළු ලකුණු 80 ක් ඉක්මවූ සියලු දෙනාට පත්වීම් ලබාදී ඇති බවද ඒ අනුව ගුරු පත්වීම් ලැබීම සඳහා පැමිණිලිකරුට හොඳින්ම ලකුණු ප්‍රමාණවත් වූවද, 2017.12.04 දින පත්වීම් ලබාදීමේදී පැමිණිලිකරුට පත්වීමක් ලබානොදුන් බවද ප්‍රකාශ කර ඇත.

මේ පිළිබඳව පැමිණිලිකරු වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසූ විට පැමිණිලිකරු සංවර්ධන නිලධාරී ලෙස සේවයේ යෙදී සිටින හෙයින් පත්වීම් ලබානොදුන් බව සඳහන් කරන ලද බවත්, එසේ වුවද, ඉහත බඳවා ගැනීම සඳහා පළ කරන ලද ඉහත ගැසට් නිවේදනයේ උපාධියට සරිලන රජයේ රැකියාවක නිරත අයට පත්වීම් ලබානොදෙන බවක් සඳහන් කර නොමැති බවත් සඳහන් කර ඇත.

තවද, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ ජාතික හැඳුනුම්පත් අංක 896651889V දරණ පූර්ව ළමාවියේ සංවර්ධන නිලධාරිනී බී.එම්.සී. බණ්ඩාරනායක යන අයට ඇහැටුව හුණුගල්ලෑව කණිෂ්ඨ විද්‍යාලයට ගුරු පත්වීමක් ලබාදී ඇති බවත්, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරිනී ජාතික හැඳුනුම්පත් අංක 842913640V දරණ එම්.කේ.බී. සිල්වා යන අයට කල්පිටිය කන්දකැටිය විදුහලට ගුරු පත්වීමක් ලබාදී ඇති බවත්, මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආර්ථික සංවර්ධන නිලධාරිනී ඊ.එච්.එම්.අශෝකා කුමාරි යන අයට එවැනිම ගුරු පත්වීමක් ලබාදී ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එසේම පැමිණිලිකරු සමඟ එකම කාර්යාලයේ සේවය කරන ජාතික හැඳුනුම්පත් අංක 87808289V දරණ ඉහත සඳහන් කරන ලද ඊ.එච්.එම්. අශෝකා කුමාරි යන අය පැමිණිලිකරුට වඩා ලකුණු 14 ක් අඩුවෙන් ලබා සිටියදී පල්ලම එස්.ඩී.ආර්. ප්‍රාථමික විදුහලට පත්වීමක් ලබාදී එහි සේවය කරන බවද සඳහන් කර ඇත.

එසේම ඉහතින් සඳහන් කරන ලද එම්.කේ.බී. සිල්වා යන අය ලබාගෙන ඇත්තේ, ලකුණු 80 ක් බවද ප්‍රකාශ කරන අතර, ඒ අනුව මෙම පත්වීම් ලබාදීමේදී තමා වෙනස්කොට සැළකීමකට ලක්කොට ඇති බවත්, ඒ අනුව සිය මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්, පැමිණිල්ල මඟින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

ඉහත කී පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් 2018.01.08 දිනැති ලිපිය මඟින්ද 2018.02.02 දිනැති ලිපිය මඟින්ද 2018.01.09 දින පැවති මූලික පරීක්ෂණයේදිද කරුණු දක්වා ඇත.
ඉහත 2018.01.08 දිනැති ලිපිය මඟින් පෙන්වා දී ඇත්තේ, මෙම ගැසට් නිවේදනයට අනුව පත්වීම් ලබාදීමේදි රැකියා විරහිත හා ඌණ සේවා උපාධිධාරින්ට ප්‍රමුඛත්වය ලබාදී ඇති බවයි. උපාධිය මූලික සුදුසුකමක් වන තනතුරක දැනටමත් සේවය කරන උපාධිධාරීන්ට පළමු වටයේ පත්වීම් ලබාදී නොමැති බවද සඳහන් කර ඇත.

එසේම ගැසට් නිවේදනයට අනුව උපාධි මූලික සුදුසුකමක් ලෙස සලකන තනතුරක සේවයේ යෙදි සිටින්නන් සඳහා පත්වීම් ලබානොදෙන බව සඳහන් කර නොමැති බවත් ඉදිරියේදි එවැනි අයටද පත්වීම් ලබාදීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කර ඇත.

එසේම 2018.01.09 දින පැවති මූලික පරීක්ෂණයේදි වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, මෙම පැමිණිලිකරු විභාගයෙන්ද සම්මුඛ පරීක්ෂණයෙන්ද සමත්වී ඇති බවත්, ඒ අනුව ප්‍රායෝගික පරීක්ෂණයට යොමුකර ඇති අතර, එයින්ද සමත්ව ඇති බවයි.

පළමු වටයේදි අයදුම්කරුවන්ගෙන් 1183 දෙනෙකුට පත්වීම් ලබාදී ඇති අතර, එහිදි පැමිණිලිකරුට පත්වීමක් ලැබී නොමැත්තේ, පැමිණිලිකරු සංවර්ධන නිළධාරි තනතුරක සේවය කිරීම හේතුවෙන් බවද සඳහන් කර ඇත.

එසේම උපාධිය මූලික සුදුසුකමක් ලෙස සලකන තනතුරුවල සේවය කරන ලද කිහිප දෙනෙකුට පත්වීම් ලබාදී ඇති බව වගඋත්තරකාර පාර්ශවය පිළිගෙන ඇති අතර, එය අතපසුවීමකින් සිදුවී ඇති බවද ප්‍රකාශ කර ඇත.

2018.02.02 දිනැති ලිපිය මඟින් වගඋත්තරකාර පාර්ශවය දන්වා ඇත්තේ, පැමිණිලිකරුට ගුරු සේවයේ පුරප්පාඩු අනුව ඊලඟ අවස්ථාව ලබාදීම සලකා බැලීමට වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බවයි.

**නිරීක්ෂණය හා නිගමන :-**

දෙපාර්ශවය වෙතින්ම ඉදිරිපත් වී ඇති කරුණු සලකා බැලීමේදි පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාළ 'ගුරු සේවයේ බඳවා ගැනීම' සඳහා පළ කරන ලද ගැසට් නිවේදනයට අනුව අයදුම් කිරිම සඳහා සුදුසුකම් සපුරා තිබූ අයෙකු බව නිරීක්ෂණය වන අතර, එසේ අයදුම් කිරීමෙන් පසු ලිඛිත පරික්ෂණයද,සම්මුඛ පරික්ෂණයද,ප්‍රායෝගික පරික්ෂණයද සමත්ව ඇති බවත්, ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු ඉල්ලීම් කරන ලද ප්‍රාථමික විෂය සඳහා පත්වීම් ලබාදීමේදි මුළු ලකුණු 80ට වඩා වැඩිපුර ලබා ගත් සියලු දෙනාට පත්වීම් ලබාදී ඇති බව පෙනි යන අතර, පැමිණිලිකරු මුළු ලකුණු 111 ක් ලබා තිබුණද, ඔහුට පත්වීමක් ලබා දී නොමැත.

පැමිණිලිකරුට පත්වීම ලබානොදීමට හේතුව ලෙස වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇත්තේ, උපාධිය මූලික සුදුසුකමක් ලෙස සළකන සංවර්ධන නිලධාරි තනතුරක පැමිණිලිකරු සේවය කිරිමයි. ගුරු සේවයට බඳවා ගැනීම සඳහා පළ කරන ලද ගැසට් නිවේදනයට අනුව එවැනි තනතුරක සේවය කරන අයට පත්වීමක් ලබාදීමට බාධාවක් නොවන බවට පැමිණිලිකරු කර ඇති ප්‍රකාශය වගඋත්තරකාර පාර්ශවය විසින්ද පිළිගෙන ඇත. එසේම එවැනි තනතුරුවල සේවය කරන ලද කීප දෙනෙකුටම පත්වීම් ලබාදි ඇති බවට පැමිණිලිකරු මැනවින් ඔප්පු කර ඇති අතර, වගඋත්තරකාර පාර්ශවයද එසේ පත්වීම් ලබාදී ඇති බව පිළිගෙන, එය අතපසුවීමක් බව සඳහන් කර ඇත.

එසේම අදාළ බඳවා ගැනීම 'වයඹ පළාතේ පාසල් වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම' වශයෙන් දක්වා ඇති අතර, එහිදී රැකියා විරහිත හෝ ඌණ උපාධිධාරීන් ඉලක්ක කර නොමැති බව නිරීක්ෂණය වේ. එසේම වෙනත් රැකියාවක නියුතු අයකුට ලබා නොදෙන බවද දක්වා නොමැත. එබැවින් පැමිණිලිකරුට සුජාත බලාපොරොත්තුවක් (Legitimate expectation) මෙහිදී ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවයේ අවසන් ස්ථාවරයට අනුව මීළඟ අවස්ථාවේදි ගුරු පත්වීම් ලබාදීමේදි පැමිණිලිකරුට ගුරු පත්වීමක් ලබාදීම සළකා බැලීමට තීරණය කළ බව සඳහන් කර ඇතත්, නිශ්චිතව පත්වීමක් ලබාදෙන බවක් හෝ දිනයක් පිළිබඳව කරුණු සඳහන් කර නැත.

මෙම පැමිණිල්ලට අදාළව ඉදිරිපත් වී ඇති සියලුම කරුණු සලකා බැලීමේදි කිසිදු සාධාරණ පදනමකින් තොරව පැමිණිලිකරුට පත්වීම් ලබානොදී පැමිණිලිකරුට වඩා අඩු ලකුණු ලැබූ අයටද පත්වීම්

ලබාදීමෙන් මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලියේදි පැමිණිලිකරු වෙනස්කමට ලක්කර ඇති බව නිරීක්ෂණය වන අතර, එමගින් පැමිණිලිකරුට 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, ඔහු විසින් අයදුම්කර ඇති කාණ්ඩයට 2018 වර්ෂයේ සිට ගුරු පත්වීමක් ලබාදීමට වගඋත්තරකාර පාර්ශවය විසින් පියවර ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 11. 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/h